
# වීරකැටිය රාජපක්ෂ වෛද්‍ය පරම්පරාවේ ජලභීතිකා ප්‍රතිකාර ක්‍රමයේ විශේෂතා

පාරම්පරික වෛද්‍ය විමලසේන රාජපක්ෂ

## වෙද පෙළපත පිළිබඳ ව

මෙම වෙද පරම්පරාව සර්ප විෂ ප්‍රතිකාර, ජලභීතිකා ප්‍රතිකාර හා කැඩුම් බිඳුම් ප්‍රතිකාර යන ක්ෂේත්‍ර ගණනාවකට ම උරුමකම් කියයි. වර්තමානයේ සර්ප විෂ හා පිස්සු බලු විෂ සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රතිකාර කිරීම සිදුකරයි.



**වෙද පරම්පරාව දක්වෙන ගැලීම් සටහන**

**ජලභිතිකාව**

බල්ලා, බළලා, වඳුරා, රිළවා, මුගටියා, නරියා, ඌරා ආදී කුල 13කට අයත් ආසාදිත සතුන් මඟින් මෙම රෝගය වැළඳේ.

**දෂ්ට කළ විගස පැමිණෙන රෝගියකු පරික්ෂා කිරිම.**

කෑ විගස පැමිණෙණ රෝගියකුගේ ලේ ගලන තුවාලයෙන් පිස දමන ලද සම් හෝ මස් කැබැල්ලක් වෙනත් සතෙකුට කෑමට දෙයි. එම සතා එම ආහාර නොගනී නම් ආසාදිත විෂ ශරිරගත වු බවට තිරණය කරයි.

**කල්ගත වී පැමිණෙන රෝගියකු පරික්ෂා කිරිම.**

මෙහි දී දෂ්ට මුඛය වියැළී තුවාල සුව වී තිබිය හැකිය. එහි දී විශේෂ ප්‍රතිකාරයක් යෙදිම මඟින් දෂ්ට කළ විෂ ශරීරගත වී ඇත්දැයි පරික්ෂා කරයි.

ඒ සඳහා

වව්ලපිය මුල් (මස්බැද්ද කුලයේ ශාඛයක්) දෙහි ඇඹුල් අඹරා රෝගියාගේ නාසය වටා හා දෂ්ට ස්ථානයේ ආලේප කරයි. ආලේප කර ස්වල්ප වේලාවකට පසුව රෝගියාගේ ශරිරයේ දෂ්ට විෂ පවතී නම් රෝගියා උමතු ලක්ෂණ පහළ කරයි.

**උමතු ලක්ෂණ ලෙස,**

1. ඇස් රතුවීම

2. හිසරදය

3. පපුවෙහි, උදරයෙහි දාහය

4. දෂ්ට ස්ථානයේ අනින්නාක් බඳු වේදනාව ඇති වේ.

මෙම රෝග ලක්ෂණ ගිනියම් ලක්ෂණ ලෙස ද හඳුන්වයි. මෙම ගිනියම් ලක්ෂණ පහළ වී රෝගියාගේ දෝෂ කෝපතාවය ද හඳුනාගත යුතුය. ඒ සඳහා තවත් පරීක්ෂාවන් 03ක් සිදු කරයි.

1. රෝගියාට ළංකර ගිනිකුරක් ගැසීම

   මෙහි දී රෝගියා බියට පත් වේ නම් පිත් දෝෂය කෝප වී ඇත.

2. රෝගියා අසලින් ජල බඳුනක් තබා මුහුණට ජලය ස්වල්පයක් ඉසිමට තැත් කිරීම.

   රෝගියා අධික ව බියට පත් වී නම් කළු දෝෂය කෝප වී ඇත.

3. රෝගියා ආසන්නයේ පවන් සැලීම

   මෙහිදි රෝගියා බියට පත් වී නම් වාත දෝෂය කෝප වි ඇත.

මේ ආකාරයට රෝග රෝගී පරීක්ෂාව සිදුකිරීමෙන් පසු දෝෂ තත්ත්වය ද සලකා ප්‍රතිකාර කිරීම ආරම්භ කරනු ලැබේ.

ප්‍රතිකාර විධිය ප්‍රධාන ආකාර 04කි. එනම්,

1. ඖෂධ මඟින් සිදුකරන ප්‍රතිකාර
2. යන්ත්‍ර මන්ත්‍ර මඟින් සිදුකරන ප්‍රතිකාර
3. පිස්සු වට්ටවා කරන ප්‍රතිකාර
4. ලියදි කපා සිදුකරන ප්‍රතිකාර

**ඖෂධ මඟින් සිදුකරන ප්‍රතිකාර**

**අත්බෙහෙත්**

1. ලුණුවිල කඩ උනේනෙන් තම්බා පීරිසි කෝප්ප 01ක් ලබාදෙයි.

2. කඟවේනාගේ අං කැබැල්ලක් තනකිරෙන් උරච්චි කර තිත්ත තිබ්බටු ගෙඩියක් පමණ ප්‍රමාණයක් ලබාදෙයි.

පසුව අනෙක් ප්‍රතිකාර ආරම්භ කරයි.

1. **කෂාය**

තිත්ත අඟුණ - කිරි අඟුණ - රුක් අඟුණ

තුන් වර්ගය කලං 04 බැගින් ගෙන පත 8-10 සිඳ පෙරා නිවුන පසු ගිතෙල් මේස හැඳි 02ක් දමා ලබා දෙයි.

**2. හිස කුඩිච්චි යෙදීම**

ජලභීතිකා විෂ මොළය ආක්‍රමණය කිරීම නිසා එය වැළැක්වීමට ප්‍රතිකාර කළ යුතුය.

කබ කඳුළු ගැලීම, හිස කැක්කුම, කන් අවරෝධ ලක්ෂණ

ඇස් නිලංකාර වේ නම් හිසට විෂ ගමන් කර ඇති බවට තීරණය කරයි.

එවිට

රඹුක් බඩ - කළුකැම්මේරිය - මුකුණුවැන්න

එක පමණ ගෙන කොටා හිසට දමා රෙදි පටියකින් වෙලා පැය 02ක් පමණ තබා ගනි.

**සකස් කරන ලද ඖෂධ**

1. සර්ව විෂ රත්න ගුලි
2. විෂ මප්මා ගුලිය
3. සර්ව රෝග ගුලිය
4. සදරාජ් ගුලිය

ඒ ඒ අවස්ථාව අනුව මේවා දෙහි ඇඹුලෙන් ලබා දෙයි.

**උග්‍ර විෂක දි**

සඳුන්, රත්මල් දෙවර්ගය අඹරා ඇස වටා ගැමෙන් ඇස් ආරක්ෂා කරගනි.

සස්සඳ මුල් නස්න කිරීම.

**1. ඖෂධ ප්‍රතිකාරයේ විශේෂතා**

වාත දෝෂය ප්‍රධාන වූ විට ඔළිඳ, නික, ඉරමුසු ආදි ඖෂධ වර්ග ප්‍රධානව ද පිත් දෝෂය ප්‍රධාන වූ විට කප්පරවල්ලිය, එරමුසු වැනි ඖෂධ ද්‍රව්‍ය ප්‍රධානව ද ප්‍රතිකාර සිදුකරනු ලබයි.

ජලභීතිකා රෝගයේ දි දෂ්ට විෂ පවතින බවට ස්ථිර නිගමනයකින් තොරව ඖෂධ ප්‍රතිකාර සිදු නොකරයි. මන්ද ඖෂධ වීර්යෙන් අධික ඖෂධ වන බැවින් නීරෝගි අයගේ ශරීරයට ද හානි සිදුවිය හැකි බැවිනි.

සමහර රෝගීන් සුව වී ගිය පසු අධික වශයෙන් උෂ්ණ තීක්ෂතා ආහාර වර්ග ගැනීම නිසා නැවත රෝගය අක්‍රාන්ත විය හැකිය. එම නිසා ප්‍රතිකාර නතර කිරීමට ප්‍රථම සුව වූ රෝගියාට ඌරු මස්, මී කිරි, අළුපුහුල් ආදිය කෑමට දී පරීක්ෂා කර බලයි. අධ්‍යනයේ දී රෝග සමනය සඳහා මෘදු විරේචනයක් යොදාගනී. ඒ සඳහා

අරළු - කිරුස්සවැල් - කරපිංචා - සිහිදළුනු දමා කෂාය විරේක කරවයි.

**2. පිස්සු සාදවා ප්‍රතිකාර කරන ක්‍රමය**

- මෙහිදී දෂ්ටයෙන් පසු දින 21ක් ඉක්ම වූ රෝගීන් සඳහා මෙම ප්‍රතිකාර ක්‍රමය භාවිත කරයි.
- මුලින් ම රෝගියාගෙන් හා ඥාතීන්ගෙන් භාරකරුවන්ගෙන් ඒ සඳහා අවසර ලබාගත යුතුය
- උමතු වූ රෝගියා පාලනය කිරීම හා ආවතේව කටයුතු කිරීම සඳහා භාරකරුවන්ගෙන් කිහිප දෙනෙකු සූදානම් කර ගත යුතුය.
- පසුව අත්තන කොළ යුෂ රෝගියාට පොවා පැය 3, 4ක් අඳුරු කාමරයක තබාගනී.
- මෙහි දී රෝගියාගේ හැසිරීම බල්ලකු මෙන් වේ.
- පසුව රෝගියා නැවීම සිදුකරනු ලැබේ. රෝගියා ජලාශයකට ගෙනගොස් වතුර කළ 108ක් වක්කර නැවීම සිදුකරයි.
- නැවීමෙන් පසුව කැඳ වර්ග සකසා දිය යුතුය. ඒ සඳහා දියමෙනේරි, උඳුපියලිය, දියබෙරලිය කොළ ආදිය යොදාගනී.
- පසුව රෝගියාට ඖෂධ ප්‍රතිකාර ලබාදෙනු ලැබේ.

**3. ලියදි කැපිල්ල**

මෙහි දී පොකුණු ආකාරයේ ලියදි අත් පිළිවෙළට කපා එහි ජලය පුරවා තබා රෝගියා එකින් එකට මාරු කරමින් අවසාන ලියද්ද දක්වා ගෙන එමින් සිදුකරන ප්‍රතිකාර ක්‍රමයකි. වඩාත් අසාධ්‍ය රෝගීන් සඳහා මෙම ක්‍රමය භාවිත කරයි.

**4. යන්ත්‍ර මන්ත්‍ර චිකිත්සාව**

ඉහත සියලු ආකාරයේ ප්‍රතිකාරවල දී ඒවායේ ගුණාත්මක භාවය හා ශක්තිය වැඩිකර ගැනීම සඳහා යන්ත්‍ර මන්ත්‍ර භාවිත කිරීම සිදු කළ යුතු වේ. ඒ සඳහා චිකිත්සාවේ දී යොදාගනු ලබන මන්ත්‍ර මෙන් ම ප්‍රතිකාරයේදී යොදාගන්නා යන්ත්‍ර මන්ත්‍ර විධි ද භාවිත කරයි.

විශේෂ ම කාරණාව නම් මේ සියලු ප්‍රතිකාර රෝගියා උමතු වීමට පෙර සිදු කළ යුතු විමයි. ජලභීතිකාව වැළඳී උමතු වූ රෝගියෙකු සඳහා මෙම කිසිදු ප්‍රතිකාරයකින් පලක් නොවේ.